දහදිය වරිගුව

අයිස් අයිස් අයිස් බකට්

අයිස් බකට් නැම ගැන මේ වෙනකොට බොහෝ දෙනෙක් දන්නවා ඇති. ලංකාවේදි නම් ගාන දන්නෙ නැහැ. විදේශයකදි නම් සාමාන්‍යයෙන් නානකෙනා දෙන ගාණ ඩොලර් 10 යි. නාල කාව හරි නොමිනේට් කරන්න හරි කාට හරි වැලෙන්ජ් කරන්න පුලුවන්. නෑවොත් දහයයි. නැත්නම් 100 ක් දීලා ෂේප් වෙන්නත් පුලුවන්. ඒක තමයි මේකේ සාමාන්‍ය ක්‍රියාවලිය. මුදල් යන්නේ පොදු අරමුදලකට.

ලංකාවෙදි ගිරුනිකාගේ අයිස් බකට් නැම ජෝක් එකක් උනේ එයාගේ ප්‍රතිරූපයයි නාන දර්ශනයයි නිසයි. කාට හරි කියන්න පුලුවන් අයිස් නානවට වඩා ලෝකෙ වෙන වැඩ නැද්ද කරන්න කියලා. ඒත් ලෝකෙ හැටි එහෙම තමයි. මිනිස්සු හො යන්නේ අලුත් දේවල්. අපි කැමතිවුණත් නැතත්. ගිරුණිකාට පස්සෙ ලංකාවේ නමගිය කීපදෙනෙක් වැඩේට සෙට් උනත් නැගලා ගියේ නැහැ. ඒක ගිකම් කුල්ටූර් කට්ටියට විතරක් සීමා වුණා වගේ.

ලංකාව වගේ උෂ්ණ රටක මේක සාර්ථක නොවෙන්නෙ කට්ටියට යන්තම් අයිස් බකට් එකක් නෙවෙයි බැරල් එකක් වුණත් නාන්න පුලුවන් නිසාත් අර පොදු අරමුදල කියන එක ගැන තඹ සත පහක විශ්වාසයක් නැති නිසාත් කියලයි මට හිතෙන්නෙ. වැඩේ හරියට කරනවා නම් ලංකාවෙ ඔපරේෂන් කරගන්න සැලි නැතුව දහලන මිනිස්සුන්ට උදව් කරන්න මේක යස අගේට යොදාගන්න පුලුවන්. (මේ වැඩේ ආරම්භවුණොත් එහෙමනෙ)වැලෙන්ජ් එකේ ගාන රුපියල් පනහට බස්සන්න විතරයි ඕනෙ.

වැඩක් නැහැ ඕව කෙරෙන වැඩ නොවන නිසා. අපි ඒක මෙහේට ගේමු. අන්න නියම වැලෙන්ජ් එක. ඩොලර් 10 හොඳයි. මෙහේ කොපමණ නම් කට්ටිය සමිති සමාගම් ලංකාවෙ පාසල් හදන්න රෝහල් හදන්න අසරණුන්ට උපකාර කරන්න කොයි තරම් ව්‍යාපෘති කරනවද. පටන් ගමුකෝ අපිත් අයිස් බකට් ගේම. නෑවොත් 10 යි. නැත්නම් 50 කරමු කාගෙත් පහසුව තකා. ගෙදර ඉඳලා නාලා ෆොටෝ ගහලා මුණුපොතට දාන්න විතරයි තියෙන්නෙ. වැඩේ නැගලා යයි. එතකොට ඔය හෝල් බුක්කරගෙන ටිකට් ගහගෙන විසා හදාගෙන ලංකාවෙන් කට්ටිය ගෙන්නගෙන මගන්සිවෙන්න ඕනෙ නැහැනෙ. පොදු එකවුන්ට් එකක් බැංකුවක ඕපන් කරන්න විතරයි ඕනෙ. මේක විහිලුවක් නෙවෙයි. මේ වෙනකොට ස්ටුඩන්ට් මල්ලිලා වැඩේට සෙට් වෙලා ඉන්නේ. 10ක් එකවුන්ට් එකට දාලා නාලා ෆොටෝ එක මුණුපොතට දාල කාව හරි නොමිනේට් කරන්න විතරයි තියෙන්නෙ. ඒකෙ පොඩි ෆන් එකකුත් තියෙයි. නාල බලමුද අපිත් අයිස් බකට් මේ සීත රටේ?

ඔබ නැතුව ඔබ එක්ක හදවතින් බැඳුනෙමි

මම මෙල්බන් වලට එන චිත්‍රපට බොහේ විට නරඹන්න යනවා. අතරින්පතර හොඳ එකක් ඇරැණුම මේ දවස් වල එන්නෙම ඉතින් ඉතිහාස කතා රජ කතා ලව් කතා සමග වෙසක් නාට්‍ය වගේ ඒවනේ. කාලෙකට පස්සෙ රස විඳින්න පුලුවන් සිනමා පටයක් බලන්න ගියා පසුගිය දවසක. ඒක තිබුණ දවසේ තවත් සන්දර්ශන දෙකක් තිබුණා. මාර්මිඩයි සුදු අලියයි. හුගක් කල්පනා කරලා තෝරගත්තෙ "ඔබ නැතුව ඔබත් එක්ක" බලන එක. මගේ තෝර ගැනීම ගැන දැන් මම සතුටු වෙනවා. එවැනි චිත්‍රපටයක් බලන්න නොඑන තරමේ සෙනගකුත් ඇවිත් හිටියා. ලොක්කා බොක්කටම වැදුණා ෆිල්ම් එක. ආදරයක සුලබව නොදකින පැත්තක් විවරණය කිරීම ප්‍රසන්න අපූරුවට කරලා තිබුණා. දර්ශන තල අඳුර ආලෝකය කැමරා කෝණ.. අහා.. කියලා වැඩක් නැහැ. එළකිරි සහ ජලය..

මම චිත්‍රපට විචාරකයෙක් නෙවෙයි. ඒත් ලංකාවෙදි ක්ෂෙත්‍රයට සම්බන්ධ පාඨමාලා දෙක තුනක් කරලා තිබුණ නිසා වැඩේ ඇඟට දැනෙනවා. මිනිස් ජීවිතවල සැඟවි ඇති පැති කඩවල් දෙබස් රහිතව ඇස් වලින් මුහුණෙන් අපට දැනවන ආකාරය නම් මල්. බයිස්කෝප් හදන්න කෝටිතුන් හාරසිය වියදම් කරන රට වලේම දුවලා චිත්‍රපට හදන රටක අතේ ඇඟිලි ගණනක ශිල්පීන් සමග එකම ලොකේෂන් එකක පැය දෙකක් නරඹන්න ග්‍රහණය කරගන්නව කියන්නෙ නම් අපූරු වැඩක්.

ජීවිතේ දුක ආදරයේ විරහව හෙළිකරන්න අපි හැමදාම අහන දකින "මට තේරෙන්නෙ නෑ මට මොනා වෙලාද කියලා" " අපේ ජීවික හරියට මොසාගරය වගේ" දෙබස් නැතුව චිත්‍රපට හදන්න බැරි නිරමාණකාරයන් එක්ක ප්‍රසන්නල වෙඩි වගේ.

මාර වැඩේ කියන්නෙ දැහැනකට බැඳිලා වගේ චිත්‍රපටය බලාගෙන යද්දි ඒකෙ තිබුණ සමහර දෙබස් වලට මිනිස්සු හිනා උනානේ. මට හිතාගන්න බැරිවුණේ ඒක එහෙම උනේ කොහොමද කියලා. පස්සෙ ෂෝ එක බලලා එද්දි දන්න කියන හාදයෙක් "මචං උන්දෙන්නා මැරෙන්නෙ නැතුව ඉන්දියාවට පැනලා ගිහින් වැඩේ ඉවර කළා නම් ජාතික සමගියටත් හොඳක් වෙන්න තිබුණ නේද?" කියලා කියපි. උගේ මුණ දිහා බැලුව මට හිතුණේ මූත් අර හිනාවුණ එකෙක්ම තමයි කියලා.

දඹුලුත් ගිහින් තළගොයියෙකුත් මරාගමු

වෝබටන් කිව්වම කවුරුත් දන්නේ ටිකක් දුර බහැර තියෙන පන්සලක්. ශ්‍රී ලාංකිකයන්ට ඒ පන්සල වැඳ පුදා ගන්න යනවා කියන්නෙ නිකං කතරගම යනව වගේ වැඩක්. මොකද අපි කතරගම ගිහින් දේවාලෙට ගිහින් කිරි වෙහෙරත් වැඳලා එනගමන් යාලත් ගිහින් කිරිරන්දෙත් ගිහින්නෙ එන්නෙ. පවුල් පිටින් ගිහින් දානෙත් පූජා කරලා පන්සලෙන් දානෙත් කාලා වැඳ පුදාගෙන එන්න හැකි නිසා වෝබටන් ශ්‍රී ලාංකිකයන් අතර හරිම ජනප්‍රියයි. වොබටන් ගිහින් වැඳලා පුදලා බාබකිව් දාලා ආපු කට්ටියත් මෙහේ ඉන්නවා.

කාලයක් පුරාම ශ්‍රී ලාංකික බෞද්ධයන් වෝබටන් පංසල වැඳ පුදාගත් අයුරු විස්තර කරලා දිගු ලිපියක් මේ දවස් වල අන්තර්ජාලයේ සංසරණය වෙනවා. ඒක කියෙව්වම බඩ කපාගෙන මැරෙ න්න හිතුණත් අන්තර්ගත කරුණු නම් 90% ක්ම ඇත්ත. ඒක ලියල තියෙන්නෙ පංසල ගැන දැඩි අවධානයෙන් ඉන්න කෙනෙක්. අපේ බෞද්ධයෝ පංසලට එන හැටි හැසිරෙන හැටි පවුල් පිටින් ඇවිත් කුඩා කෑම පිගානක් දී වාරයක් නැතිව පිගත් පුරවාගෙන කන හැටි කුඩා ළමුන් හැසිරෙන හැටි ආදී විස්තර ගොඩයි. කාලා බීලා පංසලේ පවිත්‍රතාව ගැනවත් නොබලා යන හැටි විස්තර කරල තියෙන හැටි මනරම්.

ඇත්තටම මේක නම් මාර අපහාසයක්. කට්ටිය තමන් හැදෙන්නෙ නැතිව කන්න හදන්නේ ඒක ලියපු එකාව. කරන්න දෙයක් නැහැ. තමන් වපුරපු දේවල අස්වැන්න තමයි තමන්ට නෙළන්න වෙන්නේ. ලිපියේ ඇති බරපතළම කාරණය නම් " සිංහලයන් පංසලකට සළකන්නේ මෙහෙම නම් තමන්ගේ රටේ සුලු ජාතියක් වන දෙමළ ජනතාවට කෙසේ සළකනවා ඇද්ද යන්න සිතා ගත හැකිය" කියලා ලියපු කෑල්ල තමයි. ජාතික ගැටළුවට එක් හේතුවක් ලෙස මේ බෞද්ධයන්ගේ හැසිරීම හේතු වන්නට ඇති යයි එයින් නොකියා කියනවා. ඉතින් මා හිතවත් විනෝදකාමී ශ්‍රී ලාංකික බෞද්ධයනි. ඔබේ හැසිරීම් රටාව වහාම වෙනස් කරගන්න. වොබටන් යනව නම් සංවරව හැසිරෙන්න. සංවරව හැසිරෙන හැටි ඔබේ දරුවන්ටත් උගන්වන්න. වැඩියෙන් දානය දී අඩුවෙන් අරගන්න.

නිමා නොවනා පමාව

"අගමැතිතුමිය පමාවේ" ගල්කිස්ස වාර්තාකරු - සෙන්ට් තෝමස් විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයට අගමැතිනිය පැමිණිය යුතුව තිබුණේ සවස 5 ටය. එහෙත් අදය පැමිණියේ පහ පසුව් විනාඩි 10 ට බැවින් උත්සවය ඇගේ කණගාටුව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව පහයි දහයට පටන් ගැනීමට සිදුවිය. විනාඩි දහයක් පමා වී උත්සවයකට පැමිණීම ඇගේ ඡායාරූපයක් සහිතස පුවත්පතක පළවීමට තරම් සිද්ධියක් වීම නම් මාර වැඩක්ම තමයි. මේ අගමැතිණිය නම් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියයි. පත්තරේ නම් "හෙළබිම". වර්ෂය 1962. පසුගිය දවසක පරණ පත්තර වගයක් ලැබුණා මිත්‍රයකුගෙන්. ඒකෙම තිබුණා නැගී එන තරුවක් ලෙස ඉන්දුනි විජේබණ්ඩාර ගැනත්. ඒ වාර්තා හරිම සිත් ගන්නා සුළු විදියකට ඉදිරිපත් කරලා තිබුනා. මේ පත්තර කියවාගෙන යද්දි මට හිතණේ ජාතියක් වශයෙන් අප ලබලා තියෙන දියුණුව ගැන.

මේ කාලය කළමණාකරණය සම්බන්ධයෙන් ඒ අගමැතිනියගෙම ජනාධිපති දුව චාල්ස් කුමාරයා ගෙන්වලා තිබුණ උත්සවයකට සහභාගිවෙන්නෙ විනාඩි 45 ක් පමා වෙලා. එතකොට චාල්ස්ට මල පැනලා උත්සවයෙන් ගිහින්. ඒ පක්ෂෙම ජනාධිපතිතුමෙක් තමන් එතකල් උත්සව පැය ගණන් ආරම්භ කරන්නෙ නැතිව පමා කරනවා. ඇවිල්ලා ඉන්න උන් ආපහු යන්න බැරි නිසා කාගෙන ඉන්නවා. පමාව දැන් අපේ ජාන වලටත් මුහුවෙලා තියෙන්නෙ. අම්මපා කාලයේ වටිනාකම කාලය විසින්ම කා දමා ඇති අපූරුව. ලංකාවෙදි නම් කමක් නැහැ කියමු.

අපි ඒ සංස්කෘතිය මෙහෙටත් ගෙනත් නැද්ද? මේ රටට ඇවිල්ලාත් මොන උත්සවයද අපි වෙලාවට පටන් ගත්තෙ. 6.30 ට තිබ්බොත් පටන් ගන්නෙ 7ට. එන එවුනුත් දන්නවා පටනව්ගන්නෙ පමා වෙලා කියලා. ඒ නිසාම පමා වෙලා එනවා. ඒ ගැන නම් මාර කනගාටුවක් තියෙන්නෙ. චිත්‍රපට කලා උත්සව ගී ප්‍රසංග ආදී මොන තැනකත් තත්වය ඕකයි. කවුරු මොකා ආවත් සිදුවන්නෙ ඒකයි. වැඩේ කියන්නෙ හැමදේම හරියට කරන්න උත්සාහ කරන අපේ රතු සහෝදරවරුන්ටත් ඒක හරියට කරන්න බැරි හැටි. ඒකත් ඉතින් අපේම වෙලාව තමයි.

නිහඬ සමාජයක්

ඊය වැඩ කරපු තැනදි පොඩි කතාවක් ගියා ඕස්ට්‍රේලියාවෙ වෙසන මේ අපිද අතුළුව ජනතාව තමන්ට දරුණුවටම බලපාන සිදුවීම් සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාර ගැන. වුටි මල්ලිත් පසුගිය දවස්වල ඇබට් අගමැති තුමා ගැනයි ප්‍රිලියා ගැනයි ධනාත්මකව ලිව්වනේ. ඒ නිසාම තමයි අද ඒ ගොල්ලන්ගේ තීරණ ගැන මේ සටහනත් ලියන්නෙ. ඇත්ත තමයි. ඇබට් මහත්තය කියන දේ කරනවා. දැං පනුගිය මැතිවරණයට ඉස්සෙල්ලා පනල් ගිම්කරුවන්ට වුණ පොරොන්දුව ඔහු ගිය සතියේ ඉටු කළා. දැන් පනල් කාරයන් පනල් බදු ගෙවන්න ඕනෙ නැහැ. ඒ බද්ද ඉවරයි. වැඩකරන මහජනතාවගේ සුපර් එකේ වර්ධනය නවතා දමන්න තීරණය කළා. කොම්පැනිකාරයෝ 20ක් සතුටු කිරීම වෙනුවෙන් කෝටිගාණක් මහජනතාවගේ සුපර් එකට තට්ටු කළා. කොහොමත් පාමර් මහත්තයත් අගමැතිතුමා සමග සෙට් වුණා. නොවී කොහොමද. ඔහුත් පනල් ගිම්යෙක්නෙ. එතකොට මේ තීරණ දෙකම ඕස්ට්‍රේලියානු ජනතාවගේ ඉදිරි අනාගතයට සෘජු වම බලපාන ප්‍රධානම කාරණා දෙකක්. මේ පියවරේ ප්‍රතිඵල ඉදිරියේදී බලාගන්න පුලුවන් වෙයි.

දැන් ඉතින් මේ පියවර පිළිබඳව රටේ ජනතාවගෙ ප්‍රතිචාරය කොහොමද?

අපේ කතාව අරඹුනේ එතනින්. හාල් සේරුවේ ප්‍රශ්නයට හර්තාල් කරපු රටක හිටපු අපි අපේ වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් පිනට් කරලා වර්ජන කරලා දිවි පුදලා සටන් කරපු අපට මේ ඕස්ට්‍රේලියානු ජනතාවගේ නිහඬ ප්‍රතිචාරය නම් දිරවාගන්න අමාරුයි. එතකොට වෘත්තිය සමිති ව්‍යාපාරය හරියටම වෙලාවට පඩියෙන් සමිතියේ ගාණ කපාගන්න එක අරුණාම මේ ගොල්ලන් වෙනුවෙන් මොකුත්ම කරන්නෙ නැද්ද?

මචංලා මෙහේ මිනිස්සු ආණුඩුවට රිටන් එක දෙන්නෙ ඉලෙක්ෂන් ඒකේදි. ඒක උන් ගාණට කරනවා. තමන්ගෙ විරෝධය පාන්නේ ඒ විදියට. උන් ගහ මරා ගන්නේ නැහැ. ඒ එක මිත්‍රයෙකුගෙ අදහස.

පිස්සුද මෙහේ ඉන්න මිනිස්සු මෝඩයි. උන්ට අවබෝධයක් නැහැ. ඇබට් සියල්ල විනාශ කළාට පස්සෙ ඉලෙක්ෂන් එකකින් ලාව පන්නලා දාලා ඇති වැඩේ මොකක්ද? ඊළඟට එන උන් ඇබට් නැති කරලා ගිය දේවල් ආපහු අරගෙන දෙනවද? ඒ කිව්වෙ තව මිත්‍රයෙක්.

මෙහේ මිනිස්සුන්ට අවබෝධයක් නැහැ කියන එක නම් පිළිගන්න අමාරුයි. යකෝ මෙච්චර දියුණු තාක්ෂණය සහිත මාධ්‍ය ජාලයක් තියෙන ඒඩී-එස්එල් අන්තර්ජාල පහසුකම් මුළු රටටම තියෙන ජනතාවක් කොහොමද කිසිවක් නොදැන ඉන්නෙ? එහෙම නම් මුන්ගේ සාක්ෂරතාව පහළ ඇති අපටත් වඩා.

තවත් අපේ සගයෙක් නියම කතාවක් කිව්වා. "ඕස්ට්‍රේලියාවෙ ඉන්නව වගේ කටවල් වගගත්ත මිනිස්සු ටිකක් ලංකාවෙ හිටිය නම් මහින්දට සදාකල් ජනාධිපති වෙලා ඉන්න තිබ්බා"

වාදේ නැගල ගියා. කොහොම උනත් කවුරුත් එකම මතයකට ආවෙ නැහැ. ජනතාවගේ ප්‍රතිචාර සම්බන්ධයෙන්. හැමෝම පොදු වශයෙන් එකඟ වුණේ සිය අයිතිවාසිකම් කප්පාදු කිරීඹ සම්බන්ධයෙන් ජනතාව මෙයිට වඩා දැඩි ලෙස ප්‍රතිචාර දැක්වීමය යුතුය කියන එකයි. අපේ වැඩිමහල් මිත්‍රයා වාදය අවසන් කළේ "හරි මචංලා.. අපි ජනතාව දැනුමෙන් සන්නද්ධ කරමු ඇබට් මෙඩිකෙයා එකටත් වැඩේ දුන්නට පස්සෙ" කියලා.

වුටි මල්ලි